# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2059/3 - 2018 පෙබරවාරි මස 19 වැනි සඳුදා - 2018.02.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KEG/LAN/AQUIS/A3/1/105.
*ඉඩම් අමා. අංකය*: 4-3/15/2016/VE/238.

කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නායයාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම පාරඹේවත්ත, පාරඹේ කොටස නැමති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කරගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 57බී දරන බොස්සැල්ල ග්‍රාම නිලධාරි වසමේ පාරඹේ ගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක මූ.පි. කැ. 3562 දරන මූලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 01 ක් වේ.

*වන්දි හිමිකම් පරීක්ෂණ දින :*

මූ.පි.කැ. 3562 පිඹුරේ කැ. අංක 01 සඳහා මාර්තු 20 වැනි දින පෙ.ව. 9.30 ට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වේලාවන්හිදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 මාර්තු මස 06 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත්කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. ටී. ආර්. නාලිකා පියසේන,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කෑගල්ල.

2018 පෙබරවාරි මස 14 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

උපලේඛනය

**මූ.පි.කැ. 3562 පිඹුරේ**

කැබලි අංක : 01
ඉඩමේ නම: පාරඹේවත්ත (පාරඹේ කොටස) ; හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය: 01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කොළඹ. 02. කළමනාකරණ අධ්‍යක්ෂ, කෑගල්ල වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර, නාවින්න, මහරගම ප්‍රමාණය: හෙක්ටයාර් 2.6295.

03-209


1A - G 27134 - 32 - (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.